## ■ 医療機関

医療機関で診察を受けるときは、健康保険証を必ず持っていきます。症状に応じた科のある医療機関に行きます。診察時間は医療機関によって異なりますので、前もって確認しておくと良いでしょう。大きい病院ではかなり待たされることがあります。

医療機関では、まず、受付で健康保険証と診察券を提示します。次に、問診票が渡されますので、今の病気の状況や、今までかかった重い病気やアレルギーの有無などについて書きます。外国語で診察できるところは限られていますので、注意してください。

### ◇診察時に役立つ多言語問診票

多言語で翻訳した問診票を下記のホームページで公表しています。質問用紙に記入し、病院に持って行ってください。

http://www.qq.pref.chiba.lg.jp/pb_medicalchecklist

### ◇ちば救急医療ネット

病院・診療所を受診する際に役立つ千葉県内の医療機関情報を、次のホームページで提供しています。外国語での対応ができる医療機関が検索できます。（日本語のみ）

http://www.qq.pref.chiba.lg.jp/

### ◇日本を安心して旅していただくために -具合が悪くなったとき-(観光庁)

外国人が病院に行ったときの基本的な応答、症状などを多言語で紹介しています。

英語、中国語、韓国語

https://www.jnto.go.jp/emergency/jpn/mi_guide.html

## ■ වෛද්‍ය මධ්‍යස්ථාන

ඔබ වෛද්‍ය මධ්‍යස්ථානයකට යන විට ඔබේ සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත රැගෙන යාමට වග බලා ගන්න. ඔබේ රෝග ලක්ෂණ වලට අනුරූප වන ඒකකයක් ඇති වෛද්‍ය මධ්‍යස්ථානයකට යන්න. ප්‍රතිකාර වේලාවන් වෛද්‍ය මධ්‍යස්ථානය අනුව වෙනස් විය හැකිය. එබැවින් කල්තියා පරීක්ෂා කර බැලීම සුදුසු වේ. එසේ නොකළහොත් ඔබට  රෝහලක දිගු වේලාවක් බලා සිටීමට සිදු විය හැකිය.

වෛද්‍ය ආයතනයකදී පිළිගැනීමේ කවුන්ටරයට පළමුව ඔබේ සෞඛ්‍ය රක්‍ෂණ කාඩ්පත සහ රෝගීන් ලියාපදිංචි කිරීමේ කාඩ්පත  පෙන්වන්න. මීළඟට, ඔබට වෛද්‍ය ප්‍රශ්නාවලියක් ලබා දෙනු ඇත. එබැවින් කරුණාකර ඔබගේ වත්මන් රෝගය සහ ඔබ මෙතෙක් මුහුණ දී ඇති  ඕනෑම රෝගයක්, බරපතල රෝගාබාධ  හෝ අසාත්මිකතාවයන් පිළිබදව එහි සඳහන් කරන්න. ඔබට විදේශීය භාෂාවලින් උපදෙස් ලබා ගත හැකි ස්ථාන ගණන සීමිත බව කරුණාවෙන් සලකන්න.

### ◇වෛද්‍ය පරීක්ෂණ සඳහා ප්‍රයෝජනවත් වන බහු භාෂා ප්‍රශ්නාවලිය

විදේශ භාෂා ගණනාවකට පරිවර්තනය කරන ලද වෛද්‍ය ප්‍රශ්නාවලි පහත වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.  කරුණාකර ප්‍රශ්නාවලිය පුරවා රෝහලට යන විට රැගෙන යන්න.

http://www.qq.pref.chiba.lg.jp/pb_medicalchecklist

### ◇චිබා හදිසි වෛද්‍ය සත්කාර ජාලය

චිබා ප්‍රාන්තයේ වෛද්‍ය ආයතන පිළිබඳ තොරතුරු පරීක්ෂා කිරීමේදී රෝහල් හෝ සායනවල විස්තර ප්‍රයෝජනවත් වේ. ඔබට මෙහි විදේශ භාෂාවලින් වෛද්‍ය පහසුකම් ලබාගත හැකි වෛද්‍ය මධ්‍යස්ථාන පිළිබදව සෙවිය හැක. (ජපන් භාෂාව පමණි)

http://www.qq.pref.chiba.lg.jp/

### ◇ජපානයේ ආරක්ෂිත ගමන් සඳහා - ඔබට අසනීපයක් දැනෙන විට - (ජපාන සංචාරක ඒජන්සිය)

විදේශීය පුද්ගලයෙකු අසනීප තත්වයකට පත් වූ අවස්ථාවක භාවිත වන රෝග නාම ඇතුළු මූලික වෛද්‍ය තොරතුරු මෙහි විවිධ භාෂාවලින් හඳුන්වා දී ඇත.

ඉංග්‍රීසි භාෂාව, චීන භාෂාව, කොරියානු භාෂාව

https://www.jnto.go.jp/emergency/jpn/mi_guide.html

### ◇千葉県外国人相談

外国語で診察できる近くの病院を紹介してもらえます。

電話:043-297-2966

英語、中国語、スペイン語、タガログ語、ベトナム語、韓国語、ネパール語、タイ語、ポルトガル語、インドネシア語、ロシア語、ヒンディー語

月曜日～金曜日

午前9:00～12:00、午後1:00～4:00

(年末年始、祝日は休み)

*手助けが必要な場合、ボランティアの通訳が必要なときは「日本赤十字社千葉県支部」に電話(043-241-7531)してください。言語や地域に限りがありますが、ボランティアの通訳を派遣しています。

## ■ 医療保険

病気やけがをしたときに、医療費の負担を軽くするためには、日本では公的な医療保険に加入しなければなりません。公的医療保険には、勤務先で加入する健康保険と、市区町村役所で加入する国民健康保険の2種類があります。

この他、任意に加入できる保険として、民間の医療保険などもあります。

### ◇健康保険

健康保険は、会社などの事業所で働き始めてから加入します。事業所から「被保険者証」(「保険証」といいます)を受け取ります。事業所が健康保険の適用を受けていない場合は、国民健康保険に加入します。

保険料は毎月の給料から差し引かれ、本人と事業主が50%ずつ負担します。

保険指定の病院で保険証を提示すると医療費の30%を払うだけで診療を受けることができます。

詳しいことは、お近くの年金事務所に問い合わせてください。

### ◇විබා උපදේශන සේවය

මෙම සේවාව මගින් ඔබට විදේශීය භාෂාවකින් ප්‍රතිකාර ලබා ගත හැකි රෝහලක් හඳුන්වා දෙනු ඇත.

දුරකතන: 043-297-2966

ඉංග්‍රීසි භාෂාව, චීන භාෂාව, ස්පාඤ්ඤ භාෂාව, තග්ලොග් භාෂාව, වියට්නාම භාෂාව, කොරියානු භාෂාව, නේපාල භාෂාව, තායි භාෂාව, පෘතුගීසි භාෂාව, ඉන්දුනීසියානු භාෂාව, රුසියානු භාෂාව, හින්දි භාෂාව

සඳුදා සිට සිකුරාදා දක්වා

පෙ.ව. 9:00 - ප.ව. 12:00, ප.ව. 1:00 - ප.ව. 4:00

(වසර අවසාන අලුත් අවුරුදු නිවාඩු සහ අනෙකුත් රජයේ නිවාඩු දින හැර)

* ඔබට සහය හෝ ස්වේච්ඡා පරිවර්තනයක් අවශ්‍ය නම්, කරුණාකර චිබා ජපන් රතු කුරුස සංගමය දුරකථනයෙන් (043-241-7531) සම්බන්ධ කර ගන්න. ඔවුන් ස්වේච්ඡා පරිවර්තකයෙකු එවනු ඇත (සීමිත භාෂා සහ කලාප පැවතිය හැකිය).

## ■වෛද්‍ය රක්ෂණාවරණය

ජපානයේදී, අසනීප වීමකදී හෝ තුවාල ලැබීමකදී වෛද්‍ය වියදම් අවම කර ගැනීම සඳහා ඔබ වෛද්‍ය රක්ෂණයකට ලියාපදිංචි විය යුතුය. මහජන සෞඛ්‍ය රක්ෂණ වර්ග දෙකක් පවතින අතර, ඔබ ඔබේ රැකියා ස්ථානය හරහා ලියාපදිංචි වන සේවා යෝජකයාගේ සෞඛ්‍ය රක්ෂණ සැලැස්ම සහ ඔබ ඔබේ නගර සහ ප්‍රාදේශීය සභා කාර්යාල වලට ඇතුළත් වන ජාතික සෞඛ්‍ය රක්ෂණ සැලැස්ම එම රක්ෂණයන් වේ.

ඊට අමතරව, ඔබට පුද්ගලික සෞඛ්‍ය රක්ෂණ සැලැස්මකට ඇතුළත් වීමද තෝරා ගත හැකිය.

### ◇සේවායෝජකයාගේ සෞඛ්‍ය රක්ෂණ සැලැස්ම

ඔබ සමාගමක හෝ ව්‍යාපාරික ස්ථානයක රැකියාව කිරීම ආරම්භ කරන අවස්ථාවේ ඔබව සේවා යෝජකයාගේ සෞඛ්‍ය රක්ෂණ සැලැස්මට ඇතුළත් වේ. ඔබගේ සේවා ස්ථානයෙන් ඔබට රක්ෂණ කාඩ්පතක් ("හි-හොකෙන්ශා-ශො" හෝ "හොකෙන්ශො" ලෙස හැඳින්වේ) හිමිවෙනු ඇත. ඔබගේ සේවා ස්ථානයේ සේවා යෝජකයාගෙන් සෞඛ්‍ය රක්ෂණ සැලැස්මක් නොලැබෙන්නේ නම්, ඔබට ජාතික සෞඛ්‍ය රක්ෂණ සැලැස්මට ඇතුළත් විය හැකිය.

රක්ෂණ වාරිකය ඔබේ මාසික වැටුපෙන් අඩු කරනු ලැබේ. රක්ෂණ වාරිකය ඔබෙන් සහ ඔබේ සේවා යෝජකයාගෙන් වෙන් වෙන් වශයෙන් 50%ක කොටසක් වේ.

ඔබ සේවා යෝජකයාගේ සෞඛ්‍ය රක්ෂණ සැලැස්ම මගින් නම් කරන ලද රෝහලකදී ඔබගේ රක්ෂණ කාඩ්පත ඉදිරිපත් කරන්නේ නම්, ඔබට වෛද්‍ය පරීක්ෂණයක් සඳහා ගෙවිය යුතු වන්නේ වෛද්‍ය ගාස්තුවෙන් 30%ක් පමණි.

වැඩි විස්තර සඳහා කරුණාකර ඔබේ ප්‍රදේශයේ සමාජ විශ්‍රාම වැටුප් කාර්යාලය අමතන්න.

・千葉年金事務所
電話：043-242-6320
・幕張年金事務所
電話：043-212-8621
・船橋年金事務所
電話：047-424-8811
・市川年金事務所
電話：047-704-1177
・松戸年金事務所
電話：047-345-5517
・木更津年金事務所
電話：0438-23-7616
・佐原年金事務所
電話：0478-54-1442

・චිබා විශ්‍රාම වැටුප් කාර්යාලය
දුරකතන: 043-242-6320
・මකුහරි විශ්‍රාම වැටුප් කාර්යාලය
දුරකතන: 043-212-8621
・ෆුනබෂි විශ්‍රාම වැටුප් කාර්යාලය
දුරකතන: 047-424-8811
・ඉචිකවා විශ්‍රාම වැටුප් කාර්යාලය
දුරකතන: 047-704-1177
・මත්සුදො විශ්‍රාම වැටුප් කාර්යාලය
දුරකතන: 047-345-5517
・කිසරසු විශ්‍රාම වැටුප් කාර්යාලය
දුරකතන: 0438-23-7616
・සවරා විශ්‍රාම වැටුප් කාර්යාලය
දුරකතන: 0478-54-1442

## ◇国民健康保険

3 か月を超えて在留する外国人の方で、健康保険(→P36)に加入していない人は、国民健康保険の対象となります。

国民健康保険は、市区町村役所で在留カード又は特別永住者証明書を提示して申請します。

保険料は収入と扶養家族数で決まります。保険料は直接市区町村役所又は銀行、郵便局の窓口、コンビニエンスストアなどで支払います。口座振替にすることもできます。

加入すると、世帯ごとに「被保険者証」(保険証といいます)が交付されます。保険医療機関で診察を受けるときに保険証を提示すれば医療費の 30%を払うだけで診療を受けることができます。

子供が生まれたときには出産育児一時金が支給されます。

健康診断、予防接種、正常出産、美容整形、歯列矯正の費用などは保険の対象となりません。

また、自己の故意(わざと行った)の犯罪行為等で疾病又は負傷したときは、国民健康保険の対象となりません。

## ◇ජාතික සෞඛ්‍ය රක්ෂණය

ජපානයේ මාස තුනක් හෝ ඊට වැඩි කාලයක් පදිංචිව සිටින සහ (→P36) හි විස්තර කර ඇති සේවා යෝජකයාගේ සෞඛ්‍ය රක්‍ෂණ සැලැස්මට ඇතුළත් නොවූ විදේශිකයන් ජාතික සෞඛ්‍ය රක්‍ෂණ සැලැස්මෙන් ආවරණය වේ.

ජාතික සෞඛ්‍ය රක්‍ෂණ සැලැස්ම සඳහා අයදුම් කිරීම සඳහා ඔබේ පුරවැසි කාඩ්පත හෝ නගර සහ ප්‍රාදේශීය සභා කාර්යාලයෙන් නිකුත් කරන ලද විශේෂ ස්ථිර පදිංචි සහතිකය පෙන්විය යුතුය.

ඔබේ ආදායම සහ යැපෙන්නන් ගණන අනුව ඔබේ රක්ෂණ වාරිකය තීරණය වේ. රක්ෂණ වාරිකය සෘජුවම නගර සහ ප්‍රාදේශීය ර්යාලයෙන් හෝ බැංකුවේ, තැපැල් කාර්යාලයේ හෝ පැය 24 පුරා විවෘතව පවතින සුපිරි වෙළඳ සැල් වලින් ගෙවිය හැකිය. ඔබට ස්වයංක්‍රීය බැංකු හුවමාරුවකින්ද ගෙවිය හැක.

ඔබ ලියාපදිංචි වූ විට, ඔබේ නිවස සඳහා රක්ෂණ කාඩ්පතක් ("හි-හොකෙන්ශ-ශො" හෝ "හොකෙන්ශො" ලෙස හැඳින්වේ) නිකුත් කරනු ලැබේ. ඔබ ජාතික සෞඛ්‍ය රක්‍ෂණ සැලැස්ම පිළිගන්නා වෛද්‍ය මධ්‍යස්ථානයක මෙම රක්ෂණ කාඩ්පත ඉදිරිපත් කරන්නේ නම්, ඔබට වෛද්‍ය පරික්ෂණයක් සඳහා ගෙවිය යුත්තේ වෛද්‍ය ගාස්තුවෙන් 30%ක් පමණි.

දරු උපතකදී, ඔබට එකවර දරු උපත් දීමනාවක් ලැබෙනු ඇත.

ශාරීරික පරීක්‍ෂණ, ප්‍රතිශක්තිකරණ, සාමාන්‍ය දරු ප්‍රසූතිය, රූපලාවන්‍ය සැත්කම් සහ විකලාංග රෝග සඳහා වන වියදම් ජාතික සෞඛ්‍ය රක්‍ෂණ සැලැස්මෙන් ආවරණය නොවේ.

ජාතික සෞඛ්‍ය රක්‍ෂණ සැලැස්ම ඔබ හිතාමතා කරන සාපරාධී ක්‍රියාවන්ගෙන්රෝගාබාධවලට හෝ තුවාලවලට අදාළ නොවේ.

පහත අවස්ථා වලදී, කරුණාකර දින 14ක් ඇතුළත ඔබේ නගර සහා හෝ

次のような場合には、14日以内に市区町村役所に届け出てください。

ප්‍රාදේශීය කාර්යල වලට දැනුම් දීමක් ඉදිරිපත් කරන්න.

①住所や世帯主、氏名が変わったとき
②他の公的な健康保険に加入又は脱退したとき
③保険証をなくしたり、汚したりしたとき

①ලිපිනය, ගෘහ මූලිකයා හෝ නම වෙනස් කිරීමකදී
②වෙනත් මහජන සෞඛ්‍ය රක්‍ෂණ සැලසුමකට ඇතුළත් වීම හෝ ඉන් ඉවත් වීමකදී
③ඔබේ රක්ෂණ කාඩ්පත නැති වී හෝ හානි වී ඇති අවස්ථාවකදී

## ■ 介護保険

## ■වැඩිහිටි රැකවරණය සඳහා රක්ෂණාවරණය

寝たきりや認知症などで介護が必要になった時に、利用者の選択で、介護サービスを受けることができる制度です。
65歳以上の人と 40歳から 64歳までの公的医療保険に加入している人は、介護保険に加入しなければなりません。

මෙම ක්‍රමය යටතේ ඇඳේ සිටින හෝ ඩිමෙන්ශියා රෝගයෙන් පෙළෙන පුද්ගලයන්ට ඔවුන්ගේ කැමැත්ත පරිදි හෙද සත්කාර සේවාව ලබා ගත හැක.
වයස අවුරුදු 65 හෝ ඊට වැඩි පුද්ගලයින් සහ වයස අවුරුදු 40 ත් 64 ත් අතර මහජන සෞඛ්‍ය රක්‍ෂණයට ලියාපදිංචි වී සිටින පුද්ගලයින් වැඩිහිටි රැකවරණ රක්ෂණාවට ඇතුළත් විය යුතුයි.

介護サービスを利用するには、居住地の市区町村役所へ申請をし、介護の必要度について認定を受けることが必要です。介護費用は、原則として全費用の 1割が自己負担となります。
サービスの内容、費用、保険料等については、市区町村役所の介護保険担当までお問い合わせください。

හෙද සත්කාර සේවා භාවිත කිරීමට නගර සහ ප්‍රාදේශීය සභා කාර්යාල වෙත අයදුම් කර, හෙද රැකවරණ අවශ්‍යතාවය පිළිබඳ සහතිකය ලබා ගැනීම අවශ්‍ය වේ. හෙද සත්කාර සේවා ගාස්තු, සාමාන්‍ය රීතියක් ලෙස, මුළු පිරිවැයෙන් 10% ක් ඔබ විසින් දැරීමට සිදුවනු ඇත.
සේවා අන්තර්ගතය, පිරිවැය, රක්ෂණ වාරික යනාදිය පිළිබඳ විස්තර සඳහා, නාගරික කාර්යාලයේ හෙද සත්කාර රක්ෂණය භාරව සිටින නිලධාරියාව සම්බන්ධ කරගන්න.

## ■ 検診

## ■ වෛද්‍ය පරීක්ෂණ

生活習慣病を防ぐには、食生活や運動不足などに注意するとともに、定期的に健康診断を受けることが大切です。
40歳以上の人は居住地の市区町村役所が行っている基本健康診査・がん検診を受けることができます(ただし、職場で受診している人は除きます)。

費用や受診方法などは市区町村役所に問い合わせてください。

ජීවන රටා ආශ්‍රිතව ඇති විය හැකි රෝග වළක්වා ගැනීම සඳහා ඔබේ ආහාර පුරුදු සහ ව්‍යායාම මදභාවය පිළිබඳව සැලකිලිමත් වන්න. එසේම නිතිපතා වෛද්‍ය පරීක්‍ෂාවක් සිදු කිරීම ද වැදගත් වේ.
වයස අවුරුදු 40 සහ ඊට වැඩි පුද්ගලයින්ට තම පදිංචි ස්ථානයේ නගර සභා කාර්යාලය විසින් පවත්වනු ලබන මූලික සෞඛ්‍ය පරීක්‍ෂණ සහ පිළිකා පරීක්‍ෂණ වලට භාජනය විය හැකිය. (රැකියා ස්ථානයේදී පිළිකා පරීක්‍ෂණවලට භාජනය වන අය හැර)
පිරිවැය සහ අයදුම් කරන ආකාරය පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර ඔබේ නගර සහ ප්‍රාදේශීය සභා කාර්යාල අමතන්න.

## ■ 母子健康手帳

## ■මාතෘ හා ළමා සෞඛ්‍ය අත්පොත

妊娠したときは、各市区町村役所の窓口に妊娠の届出をしてください。母子の健康を記録する「母子健康手帳」と健康診査受診票などの入った別冊が交付されます。この手帳は、各種健康診査や出産の際にも必要となります。
詳しいことについては、各市町村役所にお問い合わせください。

ගර්භණීභාවයකදී කරුණාකර නගර සභා කාර්යාලයට ගර්භණීභාවය පිළිබඳ වාර්තා කරන්න. මවගේ සහ දරුවාගේ සෞඛ්‍යය වාර්තා සඳහා "මාතෘ සහ ළමා සෞඛ්‍ය අත්පොත" සමඟ සෞඛ්‍ය පරීක්‍ෂණ පෝරමය ඇතුළත් වෙනම අත් පොතක් නිකුත් කෙරේ. විවිධ සෞඛ්‍ය පරීක්‍ෂණ සහ දරු ප්‍රසූතිය සඳහා ද මෙම අත්පොත අවශ්‍ය වේ.
වැඩි විස්තර සඳහා කරුණාකර ඔබේ නගර සහ ප්‍රාදේශීය සභා කාර්යාල අමතන්න.

**・公益財団法人母子衛生研究会**

母子衛生研究会では英語・ハングル・中国語・タイ語・タガログ語・ポルトガル語・インドネシア語・スペイン語・ベトナム語・ネパール語の 10 言語版の母子健康手帳を販売しています。(一冊880円と送料)

東京都千代田区外神田2-18-7
電話:03-4334-1188
月曜日～金曜日
午前9:00～12:00、午後1:00～午後5:00
https://www.ecur.co.jp/p/item-list/list/cate_id/1/

**・ මාතෘ සහ ළමා සෞඛ්‍ය සුභසාධන සංගමය**

මාතෘ සහ ළමා සෞඛ්‍ය සුබසාධන සංගමය විසින් ඉංග්‍රීසි, හන්ගුරියානු, චීන, තායි, තග්ලොග්, පෘතුගීසි, ඉන්දුනීසියානු, ස්පාඤ්ඤ, වියට්නාම සහ නේපාල ඇතුළු භාෂා 10 කින් මාතෘ සහ ළමා සෞඛ්‍ය අත්පොතෙහි පිටපත් අලෙවි කරයි. (එක් පිටපතක්: ජපන් යෙන් 880 සමඟ කුරියර් ගාස්තු අය කරනු ලබයි)

Sotokanda,Chiyoda-ku 2-18-7, Tokyo
දුරකතන: 03-4334-1188
සඳුදා - සිකුරාදා
පෙ.ව. 9:00 - ප.ව. 12:00, ප.ව. 1:00 - ප.ව. 5:00
https://hanbai.mcfh.or.jp/faq/purchase/en

## ■ 予防接種

### ◇子どものための予防接種

子どものための予防接種は、日本では無料で受けることができます。病気ごとに定められた接種期間があるので、期間内に忘れずに接種しましょう。
日本の予防接種は、外国と違う場合がありますので、日本に来た時や、本国に戻る時は母子健康手帳などの記録をみて、各市区町村役所か小児科のある病院に相談しましょう。

## ■එන්නත්කරණය

### ◇ළමුන් සඳහා වන එන්නත්කරණය

ජපානයේදී ළමුන් සඳහා එන්නත් නොමිලේ ලබා ගත හැකිය. එක් එක් රෝග සඳහා නියමිත එන්නත් කාල සීමාවක් ඇත. එබැවින් එම කාලය තුළ එන්නත් කිරීමට අමතක නොකරන්න.
ජපානයේ රෝග නිවාරණ එන්නත් වෙනත් රටවලට වඩා වෙනස් විය හැක. එබැවින් කරුණාකර ඔබ ජපානයට පැමිණෙන විට සහ ඔබේ මව් රටට ආපසු යන විට මාතෘ සහ ළමා සෞඛ්‍ය අත්පොතෙහි ඇති වාර්තා ආදිය පරීක්ෂා කරන්න. කරුණාකර ඔබේ නගර සහ ප්‍රාදේශීය සභා කාර්යාලය හෝ ළමා රෝග අංශයක් සහිත රෝහලකින් උපදෙස් ලබා ගන්න.

### ◇外国旅行の前の予防接種

海外で感染症にかかることを防ぐため、外国へ旅行する場合、予防接種を受けることが必要となることがあります。
厚生労働省検疫所FORTH や各大使館で必要な情報を確認してください。

千葉県では、公益財団法人ちば県民保健予防財団等で予防接種を受けることができます。

### ◇විදේශගත වීමකට පෙර ලබා ගත යුතු එන්නත්

විදේශයන්හි බෝවන රෝග ආසාදනය වීම වැළැක්වීම සඳහා, විදේශ රටකට යාමට පෙර ප්‍රතිශක්තිකරණ එන්නත් ලබා ගැනීම අවශ්‍ය වේ.

අවශ්‍ය තොරතුරු සඳහා කරුණාකර සෞඛ්‍ය, කම්කරු හා සුබසාධන අමාත්‍යාංශයේ නිරෝධායන මධ්‍යස්ථානයෙන් FORTH හෝ ඔබේ රටේ තානාපති කාර්යාලයෙන් පරීක්ෂා කරන්න.
සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ රෝග නිවාරණය සඳහා වන චිබා පදනම ඇතුළු විවිධ ස්ථාන වලින් ඔබට ප්‍රතිශක්තිකරණ එන්නත් ලබා ගත හැක.

**・公益財団法人ちば県民保健予防財団**

千葉市美浜区新港32-14
電話:043-246-8664
(予約受付時間　月～金午前9:00～午後4:00)

**・ සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ රෝග නිවාරණය සඳහා වන චිබා පදනම**

Chiba-shi, Mihama-ku, Shinminato 32-14
දුරකතන: 043-246-8664
(වෙන්කරවා ගත හැක: සඳුදා - සිකුරාදා පෙ.ව. 9:00 - ප.ව. 4:00)

**·厚生労働省検疫所 FORTH**

海外の感染症の最新状況や、予防方法等を掲載しています。

https://www.forth.go.jp

**·成田空港検疫所**

成田市古込字古込1-1

電話: 0476-34-2310

**• සෞඛ්‍ය, කම්කරු හා සුබසාධන අමාත්‍යාංශයේ නිරෝධායන මධ්‍යස්ථානය FORTH**

විදේශයන්හි බෝවන රෝග සහ ඒවා වළක්වා ගන්නේ කෙසේද යන්න පිළිබඳ නවතම තොරතුරු.

https://www.forth.go.jp

**•නරිතා ගුවන් තොටුපල නිරෝධායනය**

Narita-shi, Furugome-Aza, Furugome1-1

දුරකතන: 0476-34-2310